SINHALI
GREAT QUESTIONS

2

දෙවියන් වහන්සේ පිළිබඳ සත්‍ය කුමක්ද?

# ජීවනය පිළිබඳ



# ප්‍රධාන ප්‍රශ්න

# දැයාබර මිතුර

ඔබ පසුගිය පාඩම හොඳින් කර ඇත. ඔබ පළමුවැනි පාඩම අවසන් කර ඇති හෙයින් මේ සමඟ අපි ඔබ වෙත සිත් ගන්නා පොත් පිංචක් එවා ඇත්තෙමු. එම පොත කියවා මෙම පාඩම දන්මම හදරන්න. මේ දෙකම ඔබේ ජීවිතය සරු කරයි.

මෙම තැපැල් මාර්ගික පාඩම් මාලාවේ පාඩම් හය අවසන් කළ පසු ඔබට අලංකාර සහතික පත්‍රයක් ලැබේ. පය ප්‍රදනය කරනුයේ සත්‍යතාවය පිළිබඳව ඔබේ පෙවිල්ලටත්, මෙම පාඩම් මාලාව අවසන් වන තෙක් ඉගෙනීමට ඔබ ගෙන ඇති තීරණයටත් ගරු කිරීමක් වශයෙනි.

නමුත් සියළුම පාඩම අවසන් කළ විට ඔබට ඇති වන්නාවූ යාර්ථකව නිමකළාය යන හැඟීම, සහතිකයක් ලැබීමටත් වඩා වැදගත්ය. ඔබ දන්නා අයුරු ජීවිතයේ වඩාත්ම තෘප්තිය ගෙන දෙන්නාවූ ඇත්දැකීමක් නම් තමාටම නියමකර ගත් එල්ලයක් ඇත්ත වශයෙන්ම දිනාගැනීමය.

ඔබ මෙම පාඩම සම්පූර්ණ කළ පසු එකොළොස් වැනි පිටුවෙහි ඇතුල් පැත්තේ වෙන්කර ඇති තීරයේ ඔබේ නම සහ ලිපිනය ලියන්න. ඉන්පසුව පසු පිටුවෙහි සඳහන් ලිපිනයට මේ පොත් පිංච තැපැල් කරන්න. ඔබේ පාඩම ශ්‍රේණි ගතකර තුන්වැනි පාඩම සමඟ ආපසු ඔබ වෙත ලැබෙන්නට සලස්වනවා ඇත.

දෙවියන්වහන්සේ ඔබට ආශීර්වාද කරන සේක්වා !

— අධ්‍යක්ෂක.

© 1983 All Rights Reserved
International Correspondence Institute
Brussels Belgium
D/1983/2145/77

2 වැනි පාඩම

# දෙවියන් වහන්සේ පිළිබඳ සත්‍ය කුමක්ද?

ඔබ මෙම පාඩමෙන් ඉගෙනගන්නා දේවල් නම්:

- ▲ ඔබ දෙවියන් වහන්සේ පිළිබඳ සත්‍යතාවය දැනගත යුත්තේ මක්නිසාද?
- ▲ ඔබ දෙවියන් වහන්සේ පිළිබඳ සත්‍යතාවය දැනගත යුත්තේ කෙසේද?
- ▲ දෙවියන් වහන්සේ කුමන ආකාරද?
- ▲ දෙවියන් වහන්සේට උවමනා වන්නේ ඔබ උන් වහන්සේට කුමන අයුරු නමස්කාර කරනවාටද?

පළමුවැනි කොටස

## ඔබ දෙවියන් වහන්සේ පිළිබඳ සත්‍යතාවය දැනගත යුත්තේ මක්නිසාද?

ඔබ දෙවියන්වහන්සේ පිළිබඳ සත්‍යතාවය දැනගත යුත්තේ:

උන්වහන්සේ දෙවියන්වහන්සේව සිටින හෙයිනි.

විශ්වයේ මැවුම්කාරයාණෝත්, ආණ්ඩුකාරයාණෝත් විනිශ්වයකාරයාණෝත් දෙවියන්වහන්සේය. මැවුම්කාරයාණන් වශයෙන් උන්වහන්සේ සාදන ලද සියල්ලම උන්වහන්සේට අයිතිය. ආණ්ඩුකාරයාණන් හැටියට උන්වහන්සේගේ ලෝකය සහ උන්වහන්සේගේ සියලු සත්වයන්ගේ යහපත පිණිස යම් යම් නීති උන්වහන්සේට තිබේ. විනිශ්වයකාරයාණන් වශයෙන් පුද්ගලයෙකුගෙ කීකරුකම හෝ අකීකරුකම නිසා උන්වහන්සේ දඬුවම් හෝ විපාක දෙන සේක. දෙවියන්වහන්සේ ඔබේ මැවුම්කාරයාණෝත්, ආණ්ඩුකාරයාණෝත්, විනිශ්වය කාරයාණෝත් වන හෙයින් උන්වහන්සේ පිළිබඳ සත්‍යතාවයද, ඔබෙන් උන්වහන්සේ කුමක් බලාපොරොත්තු වනසේක්ද යන්නත් ඔබ දැනගත යුතුය.



තවද දෙවියන්වහන්සේ ප්‍රේමවන්ත පියෙක් වන සේක. උන් වහන්සේ ඔබට සැබෑ ප්‍රීතිය පිරිනමන සේක. උන්වහන්සේගෙ ප්‍රේමයත් ආශීර්වාදයත් භුක්තිවිඳීම පිණිස උන්වහන්සේව දැනගැනීම ඔබට අවශ්‍ය වන්නේය.

**එය ඔබට ජීවනයට හෝ මරණයට කාරණයක් වන හෙයිනි.**

දෙවියන්වහන්සේ ජීවනය දෙන්නාවූ තැනැන්වහන්සෙ වන සේක. උන්වහන්සේ ඔබට දූන්මම ඉතා යහපත් බහුල ජීවනයක්ද මරණින් පසු කෙළවර නොවන සර්ව සම්පූර්ණ ජීවනයක්ද පිරිනමන සේක.



**මෙය කටපාඩම් කරන්න**

**යොහන් 17: 3** සදකාල ජීවනය නම් මමය. එකම සැබෑවූ දෙවියන්වහන්සේ වන ඔබ සහ ඔබ විසින් එවන ලද තැනැත්තා වන යේසුස් ක්‍රිස්තුස් ඔවුන් විසින් ඇඳින ගැනීමය.

**දෙවියන්වහන්සේව සතුටු කිරීමට ඔබ විසින් උන්වහන්සේව දැනගත යුතුම වන හෙයිනි.**

දෙවියන්වහන්සේගේ දරුවෝ උන්වහන්සේට ප්‍රේමකර උන්වහන්සේව සතුටු කිරීමට ආශා වෙත්. යේසුස් වහන්සේ ඔබේ ගැළවුම්කාරයාණන් හැටියට ඔබ පිළිගෙන තිබේ නම් ඔබ දූන් දෙවියන්වහන්සේගේ දරුවෙකු වන්නෙහිය. ඔබ කරන සියල්ලෙහිදී ඔබේ ස්වර්ගීක පියාණන්වහන්සේව සතුටු කරනු පිණිස දිනෙන් දින වඩා හොඳින් උන්වහන්සේව හඳුනා ගෙන උන්වහන්සේ කැමති වන්නේ කුමකටදැයි දූන ගැනීම ඔබට අවශ්‍ය වේ. දෙවියන් වහන්සේව සතුටු-කරනදේ කිරීමට ඔබ මවන ලද හෙයින් ජීවිතයේ සැබෑ තෘප්තිය සොයා ගැනීමට එකම මාර්ගය මෙයයි.

**ඔබේ අභ්‍යාසය සඳහා**

- හිස්තැන් පුරවන්න.
  දෙවියන්වහන්සේ පිළිබඳ සත්‍යතාවය දූනගැනීම මට වැදගත් වන්නේ:
- උන්වහන්සේ .............................. හෙයිනි.
- එය මට ...................... හෝ................. කාරණයක්වන හෙයිනි.
- දෙවියන්වහන්සේව ........................... මා උන්වහන්සේව ............. යුතුමය.
- යොහන් 17:3 ........................... නම් මේය : ........................................ වන ඔබ සහ ඔබ විසින් එවන ලද තැනැත්තා වන ..............................ඔවුන් විසින් හැඳින ගැනීමය.

දෙවැනි කොටස

# ඔබ දෙවියන් වහන්සේ පිළිබඳ සත්‍යතාවය දැනගත යුත්තේ කෙසේද?

### උන්වහන්සේගේ මැවිල්ල දෙය බැලීමෙන්.

ඔබට යමෙකු සෑදූ දේවල් දෙස බලා ඔහු ගැන යම් දේවල් ඉගෙන ගත හැකිය. ඔබ දෙවියන් වහන්සේ සාද තිබෙන්නාවූ ලෝකය දෙස බැලූ විට උන්වහන්සේ ඉතා ප්‍රඥාවන්ත බවත්, බලවත් බවත් දැන ගන්නේය.



**රෝම 1 : 20** මක්නිසාද ලෝකය මැවූ තැන් පටන් දෙවියන්වහන්සේගේ අදෘශ්‍යමාන දේ වන උන්වහන්සේගේ සදකාලිකවූ බලය හා දේවිකම මවනලද දේවලින් තේරුම් ගොස් පැහැදිලි ලෙස පෙනී යන්නේය.

### අන්‍යයන්ගෙන්,

කෙනෙකු ගැන සත්‍යතාවය ඔහුව පුද්ගලිකව දන්නාවූ අයගෙන් ඔබට සොයාගත හැකිවේ. දෙවියන් වහන්සේ පුද්ගලිකව දැන සිටි බොහෝ අය ගැන සිත් පිනවන කථා අපි බයිබලයේ කියවමු. උන්වහන්සේ ඔවුන් සමඟ කථා කළ සේක. ගැටළු විසඳූ සේක. අවශ්‍යතාවයන් පිරිමැසූ සේක. උන්වහන්සේ ඔවුන්ගේ ශරීර සුවකර ශක්තියද, ප්‍රීතියද දුන් සේක. දෙවියන් වහන්සේ වෙනස් නොවී සිටින සේක. සෑම මහාද්වීපයකම දෙවියන් වහන්සේව දන්නා සහ උන්වහන්සේට ප්‍රේමකරන්නාවූ දහස් ගණන් අයවලුන් ඔබට අද සොයාගත හැකිවේ. උන් වහන්සේ කොපමණ අනගිද යන වග ඔවුහු ඔබට කියා දෙන්නහුය.



**1 යොහන් 1 : 2,3** ඔබත් අප සමඟ පංගුකාරකම ලබන පිණිස, අප දුටුවාවූ ඇසූවාවූ ඒ දේ ඔබටත් ප්‍රකාශ කරමුව ………… එසේය, අපේ පංගුකාරකම පියාණන්වහන්සේද ස්වකීය පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේද සමඟය.

### උන්වහන්සේ කියන දෙයින්,

කෙනෙකුගේ ලියවිලි කියවීමෙන් සහ ඔහුගේ කථා ඇසීමෙන් ඔබට ඔහුව දැනගත හැකිවේ. දෙවියන් වහන්සේ බයිබලය තුළින් ඔබට කථා කරන සේක. උන්වහන්සේගේ චරිතය, උන්වහන්සේගේ සැළැස්ම, උන්වහන්සේගේ හැඟීම්, උන්වහන්සේ ඔබ කෙරෙහි තිබෙන ප්‍රේමය එයින් ඔබ සොයාගන්නෙහිය.



**යොහන් 5 : 39** ලියවිලිවල ……………<br>
ඔබ …………… සොයන්නහුය.<br>
ඒවා මා ගැන සාක්ෂි දෙයි.

### පුද්ගලික අත්දැකීමෙන්,

ඔබට කෙනෙකුව හොඳටම දැනගත හැකි වන්නේ ඔහු සමඟ ජීවත් වෙමින්, කථා කරමින් සහ ඔහු සමඟ වැඩ කිරීමෙනි. අප උන්වහන්සේව මේ අයුරු දැන ගැනීමට දෙවියන්වහන්සේට අවශ්‍යවූ - හෙයින් උන්වහන්සේගේ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව මනුෂ්‍යයන්

අතර ජීවත් වන්නට උන්වහන්සේ එවූ සේක. යේසුස්වහන්සේ උන්වහන්සේගේ පියාණන්වහන්සේ මෙන් වන හෙයින් දෙවියන්වහන්සේගේ ස්වභාවය උන්වහන්සේ තුළින් දැකගත හැකිවේ. ක්‍රිස්තුස්වහන්සේ තුළින් ඔබට දෙවියන්වහන්සේව දැනගත හැකිවේ.

> **හෙබ්‍රෙව් 1 : 1 – 3** දෙවියන්වහන්සේ ආදි කාලයෙහි බොහෝ කොටස්වලින් හා බොහෝ ප්‍රොපේතවරුන් ලවා පියවරුන්ට කථාකරවා මේ දවස්වල කෙළවරදී තමන්වහන්සේගේ පුත්‍රයාණන් ලවා අපට කථා කෙරවූ සේක......... උන්වහන්සේ දෙවියන්වහන්සේගේ මහත්තත්වයේ ප්‍රභාවයද උන්වහන්සේගේ දේවත්වයේ ස්වරූපයද වන සේක.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබේ ගැළවුම්කාරයාණන් හැටියට ඔබ පිළිගත්විට උන්වහන්සේ ඔබට දෙවියන් වහන්සේ එළිදරව් කරන සේක. දෙවියන්වහන්සේගේ වචනය කියවා යාච්ඤාවෙන් ඔබ උන්වහන්සේට කථා කරන අතර ඔබ කිසිදක සිහිනෙකින්වත් හැකිවේයයි නොසිතූ අන්දමින් ඔබ උන්වහන්සේගේ අභිමුඛය අත්දැක උන්වහන්සේව දැනගැනීමට පැමිණෙන්නෙහිය.



> **යොහන් 14:21, 23** ......................... මට ප්‍රේම කරන්නා මාගේ පියාණන් විසින් ප්‍රේම කරනු ලබන්නේය. මමද ඔහුට ප්‍රේම කොට ඔහුට ප්‍රකාශ වන්නෙමි. ..................... යමෙක් මට ප්‍රේම කරන්නේ නම්, ඔහු මාගේ වචනය රක්ෂා කරන්නේය. මාගේ පියාණන්වහන්සේද ඔහුට ප්‍රේම කරන සේක. අපි ඔහු ළඟට ඇවිත් ඔහු සමඟ වාසය කරමුව.

### ඔබේ අභ්‍යාසය සඳහා

- පහත සඳහන් ලැයිස්තුවෙහි දෙවියන්වහන්සේ හඳුනාගත හැකි හොඳ මාර්ග පහක්ද උන්වහන්සේ දැනගන්නට උපකාර නොවන මාර්ගයක්ද සඳහන් ව ඇත. ඔබට උපකාර නොවන මාර්ගය කපා හරින්න.
- ස්වභාව ධර්මය තුළින් උන්වහන්සේගේ මැවිලි දෙස බැලීමෙන්.
- දෙවියන්වහන්සේව දන්නා අයවලුන් උන්වහන්සේ ගැන කියන දේවලට සවන් දීමෙන්.
- උන්වහන්සේගේ පොත වන බයිබලය කියවීමෙන්.
- දෙවියන්වහන්සේව නොදන්නා අයවලුන් උන්වහන්සේ ගැන කියන දේවලට සවන් දීමෙන්.
- උන්වහන්සේගේ පුත්‍රයාණන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින්.
- දෙවියන්වහන්සේට යාච්ඤා තුළින් පුද්ගලිකව කථා කිරීමෙන්.

තුන්වැනි කොටස

# දෙවියන් වහන්සේ කුමන ආකාරද?

**දෙවියන්වහන්සේ අසීමිත සදකාලික ආත්මයක්ය.**

දෙවියන් වහන්සේ කාලයටවත් අවකාශයටවත් ස්වභාවධර්මයේ නීතිවලටවත් අප මෙන් සීමා නොවන සේක. උන්වහන්සේ සදා පැවතුන සේක. සදහටම පවතින සේක. උන්වහන්සේ සැමතැනම වැඩවසන සේක. උන්වහන්සේ සියලු දේම දන්නා සේක. ඕනෑම දෙයක් කළ හැකිව සිටින සේක.

**දෙවියන්වහන්සේ ත්‍රි පුද්ගල ඒක දෙවිඳුන්ය.**

සමහරු දෙවියන්වහන්සේ ගැන සිතනුයේ විශ්වය පාලනය කරන්නාවූ පුද්ගලිකත්වයක් නොමැති බලයක් ලෙසය. නැතහොත් යහපත සිදුකරන බලයක් ලෙසය. උන්වහන්සේ සිතන සේක. උන්වහන්සේට හැඟීම් ඇතිවන්නේය. උන්වහන්සේ ක්‍රියාකාරී වන සේක. එහෙයින් උන්වහන්සේ පුද්ගලයෙකු බව අපි දනිමු.

ඇත්ත වශයෙන්ම දෙවියන්වහන්සේ ත්‍රි එක දෙවිඳුන් එනම් ත්‍රි පුද්ගල ඒක දෙවිඳුන් බව බයිබලය උගන්වයි. පියාණන්වහන්සේත්, පුත්‍රයාණන්වහන්සේත්, ශුද්ධාත්මයාණන්වහන්සේත් ස්වභාවයෙනුත් බලයෙනුත් පරමාර්ථයෙනුත් එකාකාරව සිටින සේක. එකම තැනැන් වහන්සේ එකම දෙවියන්වහන්සේ වශයෙන් ඔවුහු සර්ව සම්පූර්ණ එකමුතුකමක් ඇතිව එකට ක්‍රියාකරත්.

**මතෙව් 28:19** පියාණන්වහන්සේගේත් පුත්‍රයාණන්වහන්සේගේත් ශුද්ධාත්මයාණන්වහන්සේගේත් නාමයට ඔවුන් බව්තීස්ම කරන්න.



**දෙවියන්වහන්සේ ප්‍රේමයය.**

දෙවියන්වහන්සේ ප්‍රේමයය. උන්වහන්සේගෙ ස්වභාවය ප්‍රේමයය. උන්වහන්සේ සැමදෙනාටම ප්‍රේම කරන සේක. උන්වහන්සේ ඔබට ප්‍රේමකොට ජීවිතයේ හොඳම දෙය ඔබට දීමට කැමතිව සිටිනසේක. ඉන්පසු ස්වර්ගයෙහි උන්වහන්සේගේ අනගි ගෘහයේ ඔබ උන්වහන්සේ සමඟ වාසය කරනවාට කැමතිව සිටින සේක.



**1 යොහන් 4 : 8** ප්‍රේම නොකරන්නා දෙවියන්වහන්සේව නාඳුනයි. මක්නිසාද දෙවියන් වහන්සේ ප්‍රේමයය.

**දෙවියන්වහන්සේ සර්ව සම්පූර්ණය.**

දෙවියන්වහන්සේ සම්පූර්ණයෙන්ම යහපත්ව, පිරිසිදුව, සත්‍යවාදීව, සැම ක්‍රියාවකදීම නිවැරදිව සිටින සේක. උන්වහන්සේ ත්‍යාගශීලිව කරුණාවන්තව සිටින සේක.

**මතෙව් 5 : 48.** ඔබගේ ස්වර්ගීය පියාණන්වහන්සේ සම්පූර්ණව සිටින සේක.

## දෙවියන්වහන්සේ ධර්මිෂ්ඨය

මනුෂ්‍යයාගේ යහපත උදෙසා යම් යම් නීති දෙවියන් වහන්සේ සාද තිබෙන සේක. උන්වහන්සේ ධර්මිෂ්ඨ විනිශ්චයකාරයෙකුව සිටින සේක. එයින් අදහස් කරන්නේ උන්වහන්සේ හැම විටම යුක්තිය කරන බවයි. උන්වහන්සේගේ නීති පිළිපදින අයට උන්වහන්සේ විපාකදී ඒවා කඩකරන අයට දඬුවම් පමුණුවන සේක. උන්වහන්සේ අපව පාපයෙන් බේරා ගන්ට කැමතිව සිටින සේක. නමුත් එසේ කිරීමට උන්වහන්සේට අප ඉඩ නුදුනහොත් උන්වහන්සේට හැකිවන්නේ අප ලැබිය යුතු දඬුවම දීමට පමණි.

**දේශනාකාරයා 12 : 14** මක්නිසාද යහපත් වේවා, නපුරු වේවා, සියලු ක්‍රියාද සියලු රහස් දේද දෙවියන් වහන්සේ විනිශ්චයට පමුණුවන සේක.

**උත්පත්ති 18 : 25** ..............මුළු පොළවේ විනිශ්චයකාරයාණන්වහන්සේ යුක්තිය නොකරන සේක්ද?

## දෙවියන්වහන්සේ සියල්ල දන්නා සේක.

දෙවියන්වහන්සේ අතීතයත්, වර්තමානයත්, අනාගතයත් දන්නා සේක. සිදුවන සියලුදේම උන්වහන්සේට ඇසේ. පෙනේ, වැටහේ. ඔබේ සිතුවිලිද, ඔබ කරන දේද කරන්නේ මන්දැයි උන්වහන්සේ දන්නා සේක. දෙවියන්වහන්සේ ඔබට වඩා හොඳ කුමක්ද යන්න දන්නා සේක. හරි දේවල් තෝරාගන්නට ඔබට උපකාර කරන්ට උන්වහන්සේ කැමතිව සිටින සේක.

**උත්පත්ති 16 : 13** .................මා දකින්නාවූ උන්වහන්සේ (දෙවියන් වහන්සේ) ..............

**1 යොහන් 3 : 20** දෙවියන් වහන්සේ ..............සියලුදේම දන්නා නිසාය.



## දෙවියන්වහන්සේට ඕනෑම දෙයක් කළ හැකිය.

අප ස්වභාව ධර්මයේ නීති යනුවෙන් නම් කරන්නාවූ යම් යම් රටාවන් මැවුම්කාරයාණන්වහන්සේ උන්වහන්සේගේ ලෝකයට අඩංගු කරගෙන තිබෙන සේක. සැම දෙයක්ම ක්‍රියාත්මක වන්නේ මේ රටාවන් අනුවයි. දෙවියන් වහන්සේ මෙම ස්වභාවධර්මයේ නීතිවලට වඩා උතුම්වී ඒවාට සීමා නොවී සිටින සේක. මනුෂ්‍යයාගේත් ස්වභාවධර්මයේත් බලය ඉක්මවූ දේවල්, එනම් ආශ්චර්ය ක්‍රියාවන් උන්වහන්සේ කරන සේක.

යේසුස්වහන්සේ පොළවේ සිටියදී ආශ්චර්යයන් බොහොමයක් කළසේක. උන්වහන්සේ රෝගීන් සුව කළ සේක. මළවුන් නැගිට වූ සේක. ජීවිත වෙනස් කළ සේක. උන්වහන්සේ තවමත් ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයාණන්ව සිටින සේක. උන්වහන්සේ අපගේ ශරීරයත් ආත්මයත් සුවකිරීමට ප්‍රියකරන සේක.



**මතෙව් 19 : 26** ..............දෙවියන් වහන්සේට සියල්ලම පුළුවන.

**නික්මයාම 15 : 26** ....................මම වනාහි නුඹ සුවකරන්නාවූ ස්වාමීන් වහන්සේ යයි කී·සේක.

**ඔබේ අභ්‍යාසය සඳහා**

- පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් එකක් අයත්‍යයෙ. එය කපා හරින්න.
- දෙවියන්වහන්සේ ඔබට ප්‍රේමකර ඔබට උපකාර කිරීමට කැමැත්තෙන් සිටින සේක.
- දෙවියන්වහන්සේ පාපයට දඬුවම්කරන ධර්මිෂ්ඨ විනිශ්චයකාරයෙකුව සිටින සේක.
- දෙවියන්වහන්සේ පුද්ගලිකත්වයක් නැති බලවේගයක් වන සේක.
- දෙවියන්වහන්සේ සැමදේම සැම තැනම දන්නා සේක. දකින සේක.
- සිතන්න: දෙවියන්වහන්සේ ඔබ ගැන සෝදිසියෙන් සිටීම ඔබට හොඳයැයි හැඟෙනවාද? නැතහොත් එයින් ඔබට අපහසුතාවයක් දැනෙනවාද? ඒ මන්ද?

සතරවැනි කොටස

# දෙවියන් වහන්සේට උචිතනා වන්නේ ඔබ උන්වහන්සේට කුමන අයුරු නමස්කාර කරනවාටද?

අපි දෙවියන් වහන්සේට නමස්කාර කිරීමෙන් උන්වහන්සේට ප්‍රේම කරන බවත්, ගෞරවකරන බවත්, උසස් කොට සලකන බවත් දක්වමු. අපි උන්වහන්සේ කර තිබෙන දේවලට ස්තුති කරමින් උන්වහන්සේට කථාකරමු. මනුෂ්‍යයන් විවිධ ආකාරයෙන් දෙවියන්වහන්සේට නමස්කාර කරනවා, විවිධ දේවස්ථානවලදී ඔබ දකින්නෙහිය. උන්වහන්සේට අවශ්‍යවන්නේ ඔබ උන්වහන්සේට කුමන අයුරු නමස්කාර කරනවාටද? උන්වහන්සේව සතුටුකරන්නේ කෙසේද?

**අවංක සහ සත්‍යවාදී වන්න.**

ඔබ ප්‍රකාශ කරන දේ අදහසක් ඇතිවම අවංකවම ප්‍රකාශ කළ යුතුයි. උන්වහන්සේව අදහා ගැනීමටත් උන්වහන්සේට කීකරු වීමටත් ඔබ කැමති විය යුතුයි.

> **යොහන් 4 : 24** දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද, සැබෑකමෙන්ද නමස්කාර කළ යුතුය.

> **හෙබ්‍රෙව් 11 : 6** දෙවියන්වහන්සේ වෙතට ළඟා වෙන්නන් විසින් උන්වහන්සේ විද්‍යමාන බවත් උන්වහන්සේ සොයන්නන්ට විපාක දෙන කෙනෙකු බවත් විශ්වාසකරන්ට ඕනෑය.

**දෙවියන්වහන්සේට පමණක් නමස්කාර කරන්න.**

ඔබේ මැවුම්කාරයාණෝ එකම සැබෑවූ දෙවියන් වහන්සේ වන සේක. අප උන්වහන්සේට මුළු සිතින්ම ප්‍රේම කිරීම හා කීකරුවීමත් උන්වහන්සේට පමණක් නමස්කාර කර යාච්ඤා කිරීමත් උන්වහන්සේ ඔබෙන් බලාපොරොත්තු වන සේක.

**නික්මයාම 20 : 3** මා ඇර අන් දෙවිවරු ඇතිව නොසිටිනු.

**ක්‍රියා 14:15 17:29** ............ අපිත් ......... ඔබ මේ නිශ්ඵල දේවලින් දුරුව ....... ජීවමානවූ දෙවියන් වහන්සේ වෙතට හැරෙන පිණිස ශුභාරංචිය ඔබට ගෙනෙමුව. අප විසින් දේවත්වය වනාහි මනුෂ්‍ය ශිල්පයෙන් හා සමර්ථකමින් කැපූ රනටවත් රිදීයටවත් ගලටවත් සමානයයි නොසිතිය යුතුය.

**දෙවියන්වහන්සේගේ ආශිර්වාද වලට උන්වහන්සේට ස්තූතිවන්ත වන්න.**

ගීතිකා හා යාච්ඤා තුළින් සහ නමාගේ සිතෙහි නිශ්චලභාවය තුළින් දෙවියන්වහන්සේගේ ප්‍රේමයටත් යහපත්කමටත් ඔබට දී තිබෙන්නාවූ සියලුම ආශීර්වාදවලටත් උන්වහන්සේට ස්තූති කරන්න.



**ගීතිකා 81 : 1** .................. දෙවියන් වහන්සේට උස්වූ ශබ්ද නගා ගී කියනු.

**ගීතිකා 150 : 6** හුස්ම ඇති සියල්ලෝම ස්වාමීන්ට ප්‍රශංසා කෙරෙත්වා. ස්වාමීන්ව ප්‍රශංසා කරනු.

**යටහත්ව නුමුත් ඇදහිල්ල ඇතිව නමස්කාර කරන්න.**

ශුද්ධ දෙවියන්වහන්සේගේ අභිමුඛයට පැමිණීමට ඔබ යහපත් මදි බව ඒත්තු ගන්න. එහෙත් ඔබ යේසුස්වහන්සේව ඔබේ ගැළවුම්කාරයාණන් හැටියට පිළිගෙන තිබෙන හෙයින් දෙවියන්වහන්සේ ඔබට කමාවදී උන්වහන්සේගේ දරුවෙකු හැටියට ඔබව පිළිගෙන තිබෙන හෙයින් ඔබේ සිතේ තිබෙන්නාවූ දෙය ඔබේ පියාට ප්‍රකාශ කරන්නාක් මෙන් උන්වහන්සේට ප්‍රකාශ කරන්න.

**ඔබේ අභ්‍යාසය සඳහා**

- සිතන්න: මෙම පාඩමෙන් අදහස් කරන සතර ආකාරය අනුව මම දෙවියන්වහන්සේට නමස්කාර කරන්නෙම්ද? එය කරන්නට මම සැලසුම් කරන්නෙම්ද?
- දෙවියන්වහන්සේ ඔබට එළිදරව්වන ලෙස ඉල්ලා ඔබේම වචන වලින් උන්වහන්සේට යාච්ඤා කරන්න. උන්වහන්සේට නමස්කාර කරන්න.

දෙවැනි පාඩම සම්පූර්ණ කිරීම ගැන අපි ඉතාමත් සතුටුවෙමු.

ඔබේ මෙම පාඩම් පොත් පිංච අප වෙත ලැබුණු විගස එය ශ්‍රේණිගතකර තුන්වැනි පාඩම සමග ආපසු ඔබවෙත එවන්නෙමු.

සයවන පාඩම සම්පූර්ණ කළ පසු අපි ඔබට අලංකාර සහතිකයක් පිරිනමන්නෙමු.

දෙවියන්වහන්සේ ඔබට වහන්සේ ආශීර්වාද කරන සේක්වා !

# ඔබේ මිතුරු, මිතුරියන්ගේ නම් සහ ලිපිනයන් අප වෙත එවන්න.

**''ජීවිතය පිළිබඳ වැදගත් ප්‍රශ්න''**

නමැති පාඩම් මාලාවේ ප්‍රථම පාඩම අපි ඔවුන් වෙත යවන්නෙමු.

**පැහැදිලිව ලියන්න.**

1. නම: ..............................................................

ලිපිනය ..............................................................

..............................................................

2. නම: ..............................................................

ලිපිනය : ..............................................................

..............................................................

3. නම : ..............................................................

ලිපිනය : ..............................................................

..............................................................

ඔබේ නම : ..............................................................

ලිපිනය : ..............................................................

..............................................................

පහත සඳහන් ලිපිනයට ලියන්න.

# ජීවිතය පිළිබඳ ප්‍රධාන ප්‍රශ්න

## පාඩම් පෙළ

1 ලෝකයට සිදුවීගෙන යන්නේ කුමක්ද?

2 දෙවියන් වහන්සේ පිළිබඳ සත්‍යය කුමක්ද?

3 ජීවිතය යනු කුමක්ද?

4 ඔබේ වැදගත්ම අවශ්‍යතාවය සපුරාගන්නේ කෙසේද?

5 මරණින් පසු කුමක් සිදුවේද?

6 සැබෑ ක්‍රිස්තියානි සභාව කුමක්ද?


අපේ ලිපිනය

**ජාත්‍යන්තර තැපැල් මාර්ගික අධ්‍යාපන ආයතනය**

තැ. පෙ. 15,

ජාඇල.